# CandleAid Lanka

**(Government Approved Charity – Reg.No.GA 201)**
**21/4, Dharmaratne Avenue, Rawathawatte, Moratuwa 10400, Sri Lanka.**
**Tel: +94 11 2642526 / Fax: +94 11 2642139**
**Email: admin@candleaid.org Website : www.candleaid.org**

## CandleAid Lanka ආයතනය මගින් සිදු කරනු ලබන ඉංග්‍රීසි කථන පුහුණු පාඨමාලාව ගැන මගෙන් වදනක් .......



මම සුලෝචනා දිල්හානි. මම වෘත්තියෙන් ගුරුවරියක්. මම මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය ප්‍රදේශයේ ජීවත් වන අතර දරුවන් තිදෙනෙකුගේ මවක්. මම ඉතාම සාමාන්‍ය පවුලක හැදී වැඩුණ අතර, අප පවුල් පරිසරය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කතා බහ කිරීමක් සිදු වුණේ නැහැ. ඒ වගේම වෙනත් මුදල් ලබා දී කරනු ලබන ඉංග්‍රීසි කථන පාඨමාලා සඳහා සහභාගී වීමට මා හට ආර්ථික වශයෙන් හැකියාවක් තිබුණේ නැහැ. එසේම මවක්, ගෘහනියක් සහ ගුරුවරියක් වශයෙන් මා ඉතාම කාර්ය බහුල නිසා මා හට එවැනි වැඩිදුර අධ්‍යාපනයක් ලබා ගැනීමට නොහැකි වුණ අතර මාගේ වෘත්තිමය ජීවිතය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කතා කිරීමට සිදු වූ අවස්ථාවලදී මා අපහසුතාවට ලක් වූ අවස්ථා බොහොමයි.

මෙවැනි පසුබිමක් තුළ මාගේ වාසනා මහිමයකට මගේ සහෝදරියගේ මාර්ගයෙන් කපිතාන් එල්මෝ ජයවර්ධන මහතා මට හඳුනා ගැනීමට හැකි වූ අතර ශ්‍රේෂ්ඨ මහත්මාණන් කෙනෙකු වූ එතුමා CandleAid Lanka ආයතනය මගින් සිදු කරනු ලබන ඉංග්‍රීසි කථන පුහුණු පාඨමාලාවට මා තෝරා ගනු ලැබුවා. කිසිදු අය කිරීමකින් තොරව online පහසුකම් තුළින් කරනු ලැබූ මෙම පාඨමාලාව හැදෑරීම තුළින් මාගේ ජීවිතයේ ඉහළ ජයග්‍රහණයක් ලබා ගැනීමට මා හට හැකි විය. ඉතාමත් සුහදශීලී, ප්‍රතිපත්තිගරුක මහත්මාණන් කෙනෙකු වූ කපිතාන් එල්මෝ ජයවර්ධන මහතා එම පාඨමාලාව සාර්ථකව නිම කිරීමට නිරන්තරයෙන් අපව ධෛර්යමත් කරමින් කටයුතු කිරීම පිළිබඳව මා සදා ණයගැතිය. සතිපතා අපහට ලබා දුන් අභ්‍යාස නිවැරදිව කිරීමෙන් හා අපහට හඳුන්වා දුන් කතා සගයින් සමගින් කථා කිරීමෙන් අපට සාර්ථක ප්‍රතිපල අත්විය. ඊට අමතරව අලුත් ඉංග්‍රීසි වචන 25ක් සතිපතා ලිවීමෙන් අපගේ වචන මාලාව නිරන්තරයෙන්ම යාවත්කාලීන විය.

*“It is better by far to light a solitary candle than to curse the darkness"*

# CandleAid Lanka

**(Government Approved Charity – Reg.No.GA 201)**
**21/4, Dharmaratne Avenue, Rawathawatte, Moratuwa 10400, Sri Lanka.**
**Tel: +94 11 2642526  / Fax: +94 11 2642139**
**Email: admin@candleaid.org  Website : www.candleaid.org**


අපගේ එම කාර්යයට සහයෝගය ලබා දුන් ඉංග්‍රීසි භාෂාව හොඳින් හසුරවන එම මහත්ම මහත්මීන්ගේ සේවාවද මා මෙහිදී ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

අප වැනි ආර්ථීක දුෂ්කරතා වලින් පසුවන අයගේ සාර්ථකත්වය වෙනුවෙන් සිදු කරනු ලබන මෙම සද්කාර්යයන්ට මා කපිතාන් එල්මෝ ජයවර්ධන මැතිඳුන් ප්‍රමුඛ සියලුම මහත්ම මහත්මීන්ට බොහොමත්ම ස්තුතිවන්ත වන අතර මා ලබා ගත් එම දැනුම තවත් අයටද ලබා දීමට පොරොන්දු වෙමි. ඔබතුමන්ලා සියලු දෙනාට තව තවත් මෙවැනි උතුම් කටයුතු කිරීමට ශක්තිය, ධෛර්යය ලැබේවායි මා ප්‍රාර්ථනා කරමි.

ස්තුතියි!

W.G. සුලෝචනා දිල්හානි
28.12.2023

070 388 2606




*“It is better by far to light a solitary candle than to curse the darkness"*